# Abstract No 65

## සීගිරි ප්‍රදේශයෙන් හමු වී ඇති මහායානික සාධක

**[1] කුසුම්සිරි කොඩිතුවක්කු, [2]ආචාර්ය චන්දන රෝහණ විතානාච්චි, [3] කල්පනී සුබෝධා බණ්ඩාර**

1. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. කෞතුකාගාර පාලක, ජේතවන කෞතුකාගාරය,
2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.
3. පුහුණුවන පර්යේෂණ නිලධාරි, සීගිරිය කෞතුකාගාරය, මධ්‍යම සංස්කෘතික අරමුදල,

සීගිරිය වඩාත් ප්‍රසිද්ධියට පත් ව ඇත්තේ ක්‍රි.ව. 5 වන සියවසට අයත් I වන කාශ්‍යප රජුගේ නගර සංකීර්ණය හා එහි නිර්මාණ කෞශල්‍යයේ විශිෂ්ටත්වය නිසාවෙනි. එහෙත් කාශ්‍යප රජුට පෙර හා පසු කාලයට අයත් ආගමික ඉතිහාසයක් හා බැඳුණු පුරාවිද්‍යාත්මක සාධක සමූහයක් සීගිරි ප්‍රදේශයෙන් හඳුනාගත හැකි ය. එම සාධක අනුව ක්‍රි.ව. 5-7 සියවස් අතර කාලපරිච්ජේදය තුළ දී සීගිරි ප්‍රදේශයෙහි බෞද්ධ ආරාම විෂයයෙහි මහායානික බලපෑම් සිදු වී ඇති බවත්, ක්‍රි.ව 8-10 සියවස් වන විට එහි උච්චස්ථානයට එළඹුණ අයුරුත් හඳුනාගත හැකි ය. සීගිරිය හා තදාශ්‍රිත ප්‍රදේශයෙන් හමු වී තිබෙන පුරාවිද්‍යාත්මක සාධක අනුසාරයෙන් ඒ පිළිබඳ ව විමසා බැලීම මෙම පත්‍රිකාවේ අරමුණ වේ. කාශ්‍යප රජු ධර්මරුචිකයන්ට පිදූ "**බෝ උපුල්වන් කාශ්‍යපගිරි විහාරය**" හා මුගලන් රජු අභයගිරි හා ජේතවන නිකායකයින්ට පිදූ "**සීගිරි දළ්හ**" හා "**දාඨා කොණ්ඩඤ්ඤ**" නම් තවත් විහාර දෙකක් පිළිබඳ ව මහාවංසයෙහි සඳහන් ය. සීගිරි දළ්හ විහාරය පිදුරංගල පර්වතය පාමුල පිහිටි පබ්බත විහාර සංකීර්ණය බව එහි ඇති ශිලා ලේඛන මඟින් තහවුරු කර ගත හැකි වේ. පිදුරංගල දගැබ කැණීමේ දී බෝධිසත්ත්ව රූප සහිත කිරිගරුඬ ඵලකයක් ද හමු වී ඇති අතර මෙම ඵලකය දැනට සීගිරි කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා තිබේ. සීගිරි ප්‍රදේශයට අයත් බෝධිසත්ත්ව ප්‍රතිමා අතරින් බහුතරය ශ්‍රී ලංකාව තුළ මහායානය ප්‍රබල ව නැඟී සිටි ක්‍රි.ව. 8-10 සියවස්වලට අයත් ය. එවැනි ප්‍රතිමා කිහිපයක් දක්ඛිණගිරි විහාරය (කළුදිය පොකුණ), මුරුංගාහිටිකන්ද, මැණික්දෙන, විහාරහින්න, සීගිරිය යන ස්ථානවලින් හමු වී තිබේ. දක්ඛිණගිරි විහාරයට සමීප කණ්ඩලම, කොත්ගල්කන්ද පාමුල පිහිටි ගල්ලෙනක (අලිගල) ඇති තාරා දෙවඟනගේ යැයි හඳුනා ගෙන ඇති සිතුවම ද ප්‍රදේශයේ මහායානික බලපෑම් පිළිබඳ වැදගත් සාධකයකි. සීගිරිය ආසන ගුහාවෙහි ද සිතුවමට නැඟි බෝධිසත්ත්ව රූපයකි. සීගිරියෙන් හමු වී ඇති කුණ්ඩලාභරණය ද බෝධිසත්ත්ව ප්‍රතිමාවකට පැළඳවීම සඳහා කරන ලද නිර්මාණයක් සේ සැලකිය හැකි ය. බෝධිසත්ත්ව ප්‍රතිමාවලට ආභරණ පැළදවීමේ චාරිත්‍රයක් තිබූ බව සාහිත්‍යමය මූලාශ්‍රවලින් ද තොරතුරු අනාවරණය වේ. සීගිරියේ සිදුකරන ලද කැණීම්වලින් හමු වූ විශ්ව වජ්‍රය නිරූපිත ලෝකඩ මුද්ද, වජ්‍ර සංකේත හා හුණුගලින් නිර්මිත තාරා දෙවගනගේ මූර්තිය සීගිරියේ පැවැති මහායානික බලපෑම් පිළිබඳ තවදුරටත් සාධක සපයයි. සීගිරි ප්‍රදේශය පදනම් කොට ගෙන සිදුකරන ලද මෙම අධ්‍යයනය අනුව සීගිරිය ආශ්‍රිත ආගමික ඉතිහාසය මහායානයට වඩාත් නැඹුරු වූවක් බවට තහවුරු කර ගැනීමෙහිලා ලැබෙනුයේ ඉමහත් පිටිවහලකි.

**ප්‍රමුඛ පදඃ-** *සීගිරිය, කාශ්‍යප රජු, මහායානය, බෝධිසත්ත්ව ප්‍රතිමා*